FREE MEDIA MOVEMENT 1992|2017
නිදහස වගකීම පෙරදැරිව
சுதந்திர பொறுப்பின் நீட்சி
SUSTAINING FREEDOM AND RESPONSIBILITY

**මාධ්‍ය නිවේදනය - 2017 සැප්තැම්බර් 28**

## තොරතුරු අයිතිය ප්‍රවර්ධනය කිරීමට මැදිහත් වෙමු - නිදහස් මාධ්‍ය ව්‍යාපාරය

තොරතුරු දැන ගැනීමේ අයිතිය නීතියක් බවට පත් වීමෙන් පසු ශ්‍රී ලාංකීය ජන සමාජයේ ඒ පිළිබඳව ඇති වී තිබෙන උනන්දුව දැනටමත් අගය කළ හැකි මට්ටමක පවතින නමුත්, තවදුරටත් එහි ඵලදායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා කළ හැකි බොහෝ දේ ඇති බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ අදහසයි. විශේෂයෙන්ම. එහිදී රජය සතුව මෙන්ම සිවිල් සමාජ සංවිධාන හා ජනමාධ්‍ය සංවිධාන ඇතුළු මෙරට මාධ්‍ය ප්‍රජාව සතුව ද විශේෂ කාර්යභාරයක් ඇති බව අපි විශ්වාස කරමු.

එවැනි පසුබිමක් තුළ ලොව පුරා ප්‍රජාව තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ දිනය සමරමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන මේ අවස්ථාවේ ශ්‍රී ලාංකිකයින් ලෙස අපගේ අවධානය යොමු විය යුතුව ඇත්තේ එම අයිතිය තවදුරටත් අර්ථවත් කරමින් එය මෙරට පුළුල් පුරවැසි ක්‍රියාකාරීත්වයක් බවට ප්‍රවර්ධනය කිරීම සඳහා ය.

තොරතුරු අයිතිය මෙරට නීතිගත කිරීමේ අවශ්‍යතාව මතු කිරීමේ සිට එය නීතියක් බවට පත් කර ගැනීම දක්වා දශක තුනකට ආසන්න කාලයක් පුරා අඛණ්ඩ අරගලයක නියැළුන නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඇතුළු මෙරට සෙසු ජනමාධ්‍ය සංවිධාන හා සමස්ත මාධ්‍ය ප්‍රජාවට එහි ලා විශේෂ වගකීමක් ඇති බව ද මේ අවස්ථාවේ අවධාරණය කරමු.

| | |
|---|---|
| **සී. දොඩාවත්ත** | **දිලීෂා අබේසුන්දර** |
| **කැඳවුම්කරු** | **ලේකම්** |


**Free Media Movement**
**Convener** | C. Dodawatta +94 777270063 **Secretary**| Dileesha Abesundara +94 772992597
Treasurer| Ananda Jayasekera +94773124850
No 96, Kirula Road, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895; Email :fmmsrilanka@gmail.com
Web | http://freemediasrilanka.wordpress.com/